# අතීත ලංකා සමාජය තුළ පැවති කුල විෂමතාවය පුද්ගල ස්වාධීනත්වයට බලපෑම් කිරීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

**[1]කුමාරි ඩබ්ලිව්.අයි.ජේ.එම්.ආර්.එන්.**

කුලය, සමාජ අසමානතාවය විදහාලන ප්‍රධානතම සාධකයකි. පුද්ගලයාට ජන්මයත් සමඟ ම කුලය හිමි වූ අතර ඔවුන් සම කුල අතර ඥාතීත්වය ගොඩනඟා ගත්හ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ සමාජ පර්යාය තුළ පවතින කුල විෂමතාවය පුද්ගලයින්ගේ ස්වාධීනත්වයට බලපෑම් කර ඇත්දැයි යන්න විමර්ශනය කිරීම යි. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පර්යේෂණය සිදු කරනු ලබයි. දත්ත එක්රැස් කරගැනීමේ දී ද්විතියික මූලාශ්‍රය භාවිතය ප්‍රධාන වශයෙන් සිදු විය. පැරණි ලංකා සමාජයේ රැකියාව, ඇඳුම් පැළඳුම්, නම හා වාසගම, නිවාස, විවාහය හා හැසිරීම් රටාව ආදී සියල්ල ම තීරණය වූයේ ඒ ඒ පුද්ගලයා නියෝජනය කරන කුල පදනම මත යි. සමාජ සංස්කෘතිය තුළ විවිධ ක්‍රියාකාරකම්වල දී උසස් කුලයන්ට සාපේක්ෂ ව පහත් කුලයන්ගේ පුද්ගල ස්වාධීනත්වයට බලපෑම් වන අයුරින් කටයුතු සිදු විය. අඩු කුල අතර වූවන් පවා සේවය සැපවූයේ තමන්ට වඩා උසස් කුලයන්ට පමණි. ආහාරපාන ගැනීමේ දී කුල හීනයන්ට, උසස් කුලීනයන්ට මෙන් නිදහසක් හිමි නොවුණි. කුඹල් ජනයාට හාන්දුරු නිවසකින් පැන් බීමේ හිමිකම් පැවතිය නමුත් අනෙකුත් අඩු කුලවලට එම වරප්‍රසාදය හිමි නොවුණි. කුල සේවා සැපයීමේ දී කුල අසමානතාවය මැනවින් දැකිය හැකි විය. රජක කුලයේ පුද්ගලයන් විසින් ඔවුන් විසූ පළාතේ බඩල් කුලයට වඩා පහත් වූ කුලයන්ට හැර, අනෙක් කුලවලට රෙදි සැපයීම ප්‍රතික්ෂේප කිරීම මෙන් ම රජකයන් විසින් ලෝකුරුවන්ගේ මංගල අවස්ථාවන්ට හා උත්සවවලට රෙදි සැපයීම ප්‍රතික්ෂේප කිරීම සිදු විය. කුල අතර ඇඳුම් පැළඳුම් භාවිතය සම්බන්ධව ද බොහෝ අසමානතාවයන් දක්නට ලැබුණි. ඉගටියෙන් ඉහළට රෙදි ඇඳීම රොඩීන්ට තහනම් වූ අතර දණහිසින් පහළට රෙදි ඇඳීම කුඹලුනට තහනම් විය. සාමාන්‍යයෙන් පහත් කුලයක අයෙක් ඉහළ කුලයක අයෙක් ඇමතීමේ දී තමුන්වහන්සේ, ඔබවහන්සේ වැනි ගෞරවාන්විත පද භාවිත විය. එහෙත් ඉහළ කුලයක කෙනෙකු විසින් පහළ කුලයක කෙනෙකු ඇමතීමේදී 'තමුන්, යුෂ්මතා, තමුසෙ හා නුඹ' යන පද යොදා ගැනුණි. විශේෂයෙන් විවාහ කටයුතුවල දී අන්තර්ජන්‍ය විවාහය පිළිගත් අතර බහිර්ජන්‍ය විවාහය ප්‍රතික්ෂේප කළේ ය. තම කුලය නොතකා කටයුතු කිරීම සමාජ ගැරහුමට හේතු වීමත් නිසා බොහෝ අවස්ථාවල කුලහීනයන්ට සමාජය තුළ ස්වාධීන ව කටයුතු කිරීමට සීමාකම් පැවතුණි. පැරණි ලංකා සමාජය තුළ උසස් කුලවලට සාපේක්ෂ ව හීන කුලවලට, එකල සමාජය තුළ තම අනන්‍යතාවය ගොඩනඟාගෙන ස්වාධීන ව කටයුතු කිරීමට කුල අසමානතාවය ප්‍රබල බලපෑමක් කර ඇත. පුරාණ ශ්‍රී ලාංකේය සමාජයේ පැවති කුල විෂමතාවය පුද්ගල ස්වාධීනත්වයට බලපෑමක් ලෙස පැවති අතර වර්තමානයේ කුල විෂමතාවය අභාවයට ගොස් ඇති ආකාරයත් අවබෝධ කරගත හැකි ය.

**මුඛ්‍ය පද :** විමර්ශනය, කුලීනයන්ට, කුල විෂමතාවය, ස්වාධීනත්වය, විවාහය

[1] සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. rasikanilmini94@gmail.com